// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2473/27 - 2026 ජනවාරි මස 30 වැනි සිකුරාදා - 2026.01.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ ගලිගමුව ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහිමිවීම හේතුකොට ගෙන ගලිගමුව ප්‍රාදේශීය සභාවේ තෝරා පත්කර ඇති සභිකයෙකුගේ ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ ගලිගමුව ප්‍රාදේශීය සභාව සඳහා තෝරා පත්කර ඇති සභිකයෙකු ලෙස පත්වූ ගොඩයලාගේ ලලිත් රෝහණ පීරිස් අයත් වන්නා වූ සර්වජන බලය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම ගලිගමුව ප්‍රාදේශීය සභාව සඳහා තෝරා පත්විය යුතු සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා අසුර පේඩිගේ අජිත් රෝහණ කුමාර කරුණාරත්න නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

ගලිගමුව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි කරුණාතිලක රාලහාමිලාගේ වසුන්දරා එරන්දි දිසානායක වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් අසුර පේඩිගේ අජිත් රෝහණ කුමාර කරුණාරත්න, ගලිගමුව ප්‍රාදේශීය සභාවේ තෝරා පත්කර ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**කේ. ආර්. වසුන්දරා ඊ. දිසානායක,**
තේරීම්භාර නිලධාරි,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2026 ජනවාරි 29 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කෑගල්ල.

EOG 01 - 0292

1A - PG 7505 — 09 (2026/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*